# Living the LOTUS

Buddhism in Everyday Life

9
2019

VOL. 168


## Founder's Essay

### රෝගයට අනුව බෙහෙත් නියම කරන්නා සේ

උපාය කෞෂල්‍යය 2 වන පරිච්ඡේදයේ, ‘සදහම් අසන ඒ හැම කෙනෙකුන් බුදුබව ලබති නිතැතින්’ සේ සඳහන් ආකාරයට බුදුන් වහන්සේ විසින් දේශනා කරන්නේ, ඕනෑම කෙනෙකුට දුකින් මිදී නිර්වානය වෙත යාමට තිබෙන සත්‍ය වූ කියාදීම් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ අඩංගු බවය. නමුත් උදාහරණයක් ලෙස, රෝගය හා රෝගයේ තත්වයට අනුව වෛද්‍යවරයා විසින් ලබාදෙන්නාවූ බෙහෙත් වෙනස් වේ. ඒ අනුව ධර්මයද එක් එක් පුද්ගලයාට, එක් පුද්ගලයාගේ දුකට අනුකූලව ප්‍රායෝගිකව ධර්මය දේශනා කරන්නේ නැතිනම්, නියමාකාරයෙන් එම පුද්ගලයන්ව දුකින් මුදවා ගැනීමට හැකි නොවේ.

සරළව පවසනවානම්, කෙනෙකුට ඇතිවී තිබෙන ප්‍රශ්න හා දුක, උපායකෞෂල්‍යය තුලින් එම පුද්ගලයන්ට ගැලපෙන බෙහෙත් වට්ටෝරුව වේ.

නමුත් අදාල පුද්ගලයන්ට එය නොතේරෙන අයුරින් ධර්ම න්‍යායන් පමණක් දේශනා කරන්නේ, තමාගේ දයාව හා කරුණාව ප්‍රමාණවත් නොවන බැවිනි.

මේ පුද්ගලයාව කෙසේ හෝ දුකින් මුදවා ගත යුතුය යන දැඩි සිතුවිල්ලෙන් කටයුතු කරන්නේ නම්, තම අත්දැකීම්, දැනුම හා සෑම දෙයම එකට බද්ධ කර උපරිම කැපවීමෙන් කටයුතු නොකර සිටිය නොහැකිය.

මෛත්‍රිය හා කරුණාවෙන් යුතුව එම පුද්ගලයාව දුකින් මුදවා ගැනීමට සැර වදන් භාවිතා කලද, ඔවුන් එය ප්‍රතික්ෂේප නොකරයි. සේම, එම පුද්ගලයා මමද කම්මැලි නොවී දුකින් මිදීමට කටයුතු කළ යුතුය යන හැඟීමට පත් කරයි.

*Kaiso zuikan* 9 පි. 66-67


**Living the Lotus**
**Vol. 168 (September 2019)**

Senior Editor: Koichi Saito
Editor: Kensuke Suzuki
Copy Editor: P.A.D. Somapala, Ruklanthi Palipana, Sahan Chamara

Living the Lotus is published monthly by
Rissho Kosei-kai International,


Fumon Media Center 3F, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 / FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජිවීතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.



# නොයෙකුත් ‘වෙනස්කම්’ තිබෙන නිසා


Rev. Nichiko Niwano
President of Rissho Kosei-kai


## සැමට ආදරය කරන්නාවූ හදවත

‘කොකින් වකෂූ’ නම ජපානයේ ප්‍රසිද්ධ පද්‍ය සංග්‍රහයකට කිනෝ සුරයුකි මහතා විසින් ඇතුලත් කළ තම ආදර හැගුම් සහිත කවියක මෙසේ සදහන් වේ. ‘සුළඟ මද නල හඹායන්නා සේ, කරයි ආදරය අප, මුහුණවත් නොදැකපු කෙනෙකුට, ලෝක ස්වභාවය එය යැයි පවසමින්’.

මෙය කියවීමෙන් පමණක්ම ආදර කවියක් බව අපට තේරුම් ගැනීමට හැකිය. නමුත්, මෙහි අප අවබෝධ කර නොගන්නා එක් ‘යථාර්තයක්’ අඩංගුය. එය නම්, සැම මනුෂ්‍යයකුම හද පත්ලෙන්ම, මෙලොව සැම පැවැත්මකටම ආදරය කරමින්, මෛත්‍රිය දක්වන බවයි.

එහෙත් වර්තමානයේ සිදුවන සමහර සිදුවීම් වලින් එසේ නොවන බවද දකින්නට ලැබේ. සිතන පතන ආකාරයේ වෙනස්කම් හේතුවෙන් රණ්ඩු සරුවල්, කල කෝලහාල හා සබැදියාවල පළුදුවීම් තුලින් රට රටවල් අතරද යුධ තත්වයන් ඇතිවේ. අවාසනාවට, ආගමික එදිරිවාදිකම්ද වර්තමානයේ බහුලව දක්නට ලැබේ. විශාල පිරිසක් අන්‍යයන් සමඟ තිබෙන වෙනස්කම් පිළිනොගෙන දුකට හා කණගාටුව පත්වෙනවා සේම, අනවශ්‍ය කල කෝලහාල ද ඇති කරගනී.

එම තත්වය තුල අපට කළ හැකිදේ නම්, අන්‍යයන් සමඟ තිබෙන වෙනස්කම් පිළිගැනීමට කටයුතු කිරීමයි. ඒ වෙනුවෙන් පළමුව කළ යුත්තේ, ‘මේ ලොව සියළුදෙනාටම ආදරය කරමින්, මෛත්‍රිය දක්වන හදවතක් මා තුල තිබේ’ යනුවෙන් අවබෝධ කර ගැනීමයි. එවිට, අන්‍යයන් හා තමා තුල තිබෙන වෙනස්කම් වල වටිනාකම දැකීමට හැකිවේ.

## 'වෙනස්කම්' වල අරුථ හා වටිනාකම

අපි එකිනෙකා නොයෙකුත් හේතූන් හා ප්‍රත්‍යයන්ට අනුව මේ ලෝකයට බිහි වී ඇත. එසේම ඉපදුනාටත් පසුව අප අවට තිබෙන පරිසරයේ හේතු ප්‍රත්‍යයන්ට අනුකූලව 'මම' කියන පුද්ගලයාගේ පෞරුෂත්වය නිර්මාණය වේ.

එබැවින් ජාතීන්ට හා පෙනුමට අනුකූලව, මනුෂ්‍යයන්ගේ සිතන හා පතන ආකාරයේ වෙනස්කම් තිබීම සාමාන්‍ය දෙයකි. එම වෙනස්කම් හේතුවක් කරගෙන එදිරිවාදිකම් ඇතිකර ගැනීමටත්, එකිනෙකා ප්‍රතික්ෂේප කිරීමත් කරන්නේ නම්, එය තම පෞරුෂත්වය පහතට හෙලාගැනීම හා සමානය.

ආගමික පරිසරය අනුවද, එක් එක් පුද්ගලයන්ට විමුක්තිය උදකර ගත හැකි මාර්ගය වෙනස් වීම සාමාන්‍ය දෙයකි. බුදු දහමට අනුව විමුක්තිය උදකර ගන්නා අය සිටිනවා සේම, කතෝලික හා මුස්ලිම් දහමට අනුව විමුක්තිය උදකර ගන්නා අයද සිටියි. එසේ විමුක්තිය ළඟා කර ගැනීමට කැමති පුද්ගලයන්ට විශ්වාස හා ගෞරව කිරීමට හැකි ඉගැන්වීම් විශාල ප්‍රමාණයක් තිබේ. මෙම පෘථිවියේ වෙසෙන සියළුම දෙනාට මානසික සහනය ලබාදීම සඳහා, නොයෙකුත් ආගම් හා ආගමික සංවිධාන විවිධ ආගමික ඇදහීම් ක්‍රම මගින් තම ස්වකීයත්වය දීප්තිමත් කරගනිමින් හා එකිනෙකට සහයෝගය දෙමින් කටයුතු කරන බව පැවසිය හැකිය.

ආගම් වෙනස් වූවත්, මනුෂ්‍යයන්ගේ මානසික සුවයට මඟ පෙන්වීමේ කරුණාව හා දයාව සෑම ආගමකම තිබේ. ආගම්වලට අනුව කරන්නාවූ කරුණාව හා දයාව දැක්වීමට අනුකූලව, අපිද හද පත්ලේ තිබෙන 'අන්‍යයන්ට ආදරය කරමින් මෛත්‍රියය දැක්වීම' යන හැඟීමේ ගැඹුරට කිදබසිමින් ප්‍රයෝගික පුහුණුවේ යෙදෙයි.......එය බුදු දහමට අනුව බෝධිසත්ව චර්යයාව වේ.

අන්‍යයන්ගේ තිබෙන්නාවූ නොයෙකුත් වෙනස්කම් නිසා විටෙක ඔවුනට කාරුණිකත්වය දැක්වීමට අපහසු වේ. එවැනි අවස්ථාවලදී අපි කළ යුත්තේ, බාහිරට යොමු වී තිබෙන තම දෑස, තම අභ්‍යන්තරයට යොමු කර තමා දෙස බැලීමයි, එවිට නොයෙකුත් වෙනස්කම් භාර ගැනීමට හැකියාව ලැබේ.

මට අන්තර්ජාතික රැස්වීම් වලදී, නොයෙකුත් අදහස් තිබෙන පුද්ගලයන් හමුවූ විට, 'මට වඩා වෙනස් ආකාරයට සිතන සිතුවිලි, විශිෂ්ටයි නේ' ලෙස හැගෙනවා. එම සිතුවිලි වල වෙනස්කම් තුලින් මම තවමත් නොදන්නා දේවල් තිබෙන බව ඉගෙන ගන්නවා.

තම අදහස් පමණක් කෑ කෝ ගසමින් දැඩිව ප්‍රකාශ කරමින්, වෙනස්කම පලිහක් කරගෙන ගැටුම් ඇති කර ගන්නවට වඩා, තිබෙන්නාවූ වෙනස්කම පිළිගෙන භාරගනිමින් සැවොම සමගියෙන් කටයුතු කළ යුතුය. එම සමගියේ පිබිදීම තුලින් අන්‍යෝන්‍ය වශයෙන් ඇතිවන සතුට, වඩා ප්‍රිතිමත් නොවන්නේද?

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ පස් වන පරිච්ඡේදය වන 'ඖෂධ පැළෑටි උපමාව' හි, 'තථාගතයන් වහන්සේ දේශනා කරන ධර්මය, එකම ස්වභාවයෙන් සහ රසයෙන් යුතු වන්නා සේ' ලෙස සඳහන් වේ. ආගම් වලට පොදුවේ තිබෙන අරමුණ හා අප හදපත්ලේ එකි නෙකා තුල තිබෙන සිතුවිලි එක් කළ විට, අපි සැවොම සතුට සැනසුම බලාපොරොත්තුවෙන් සිටින එකම අජටාකාශයේ මඟීන් වැනිය. එබැවින් 'මෙම විශ්ව සත්‍යයේ යථාර්තය, එකම ස්වභාවයකින් හා එකම රසයෙන්' යුතු බව, ලෝකයාට විදහා දැක්වීමේ වගකීම අපි සැමට භාරව තිබේ.

From *Kosei*, September 2019

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 10 වන පරිච්ඡේදය, ධර්මාචාර්යතුමෙක (පසු කොටස)

### ධර්මාචාර්යවරයෙකුගේ 5 ස් වැදැරුම් ක්‍රියාකාරකම්

ධර්මාචාර්යවරයෙකු ප්‍රායෝගික පුහුණුව ලෙස කළ යුතු දෑ.......

1 සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ලබා ගැනීම හා තබා ගැනීම (ධර්මය පිළිගෙන තබා ගන්නවා යන අධිෂ්ඨානය අළුත් කර ගැනීම)

2 කියවීම (ධර්මය නැවත නැවත ඉගෙන ගැනීම)

3 සජ්ඣායනය කිරීම (මතකයෙන් සජ්ඣායනය කළ හැකි ආකාරයට හදවතට බද්ධ කර ගැනීම)

4 පැහැදිලි කිරීම (අන්‍යයන් වෙනුවෙන්ද පැහැදිලි කර දීම)

5 ලිඛිතව පිටපත් කිරීම (ධර්මය ලොව පුරා ව්‍යාප්ත වන පරිදි උපරිම කැපවීමෙන් කටයුතු කිරීම)

ඉහත සදහන් කළ කරුණු 5, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සරණ යන පිරිස අනිවාර්යයෙන්ම පුහුණු කළ යුතුයි ලෙස සදහන් වේ. මේ එකක් හෝ නොකරන්නේ නම්, නියම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර අනුගාමිකයෙක් සේ පැවසිය නොහැකිය.

### තථාගතයන් වහන්සේගේ දූතයෙකි

මෙම ප්‍රායෝගික ක්‍රියාකාරකම් 5 තුල 'අන්‍යයන් වෙනුවෙන් දේශන කිරීම', 'ධර්මය ලොව පුරා ව්‍යාප්ත කිරීම' ආදී සක්‍රීයව කළ යුතු දෑට විශේෂ අවධානය යොමු කර ඇත. එසේ නොමැතිනම්, මෙම මානුෂීය සමාජයේ පිරිස් දුකින් මුදවා ගැනීමට නොහැකි බව සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයෙහි සදහන් වන විශේෂ ගුණාංගය වේ. මෙම පරිච්ඡේදයේද, 'මාගේ පරිනිර්වාණයෙන් පසුව යම් පින්වත් උපාසක උපාසිකාවක් රහසින් හෝ මෙම සූත්‍ර ධර්මයේ එක් ගාථාවක් හෝ අඩු තරමින් එක් වාක්‍ය ඛණ්ඩයක් හෝ යම් කෙනෙකුන්ට උගන්වන්නේ නම් ඔවුන් තථාගතයන් වහන්සේ ගේ කාර්යය ඉටු කිරීම සඳහා තථාගතයන් වහන්සේ විසින් එවන ලද කෙනෙකු බැව් ඔබ විසින් දත යුත්තේ ය. මෙම සූත්‍ර ධර්මය සකසා මහ පිරිස් මැද යම් කෙනෙක් උගන්වන්නේ නම් එහි ආනිශංස කොතරම් දැයි ඔබ විසින් වටහා ගත යුත්තේ ය' සේ ඇතුලත් වේ. මෙම වදන මෙම පරිච්ඡේදයේ ඇති වැදගත්ම කරුණ ලෙස සදහන් කළ හැකිය.




### තථාගතයන් වහන්සේගේ කුටිය, චීවරය හා සිංහාසනයේ රීතිය

කුමන ආකාරයේ හදවතකින් සක්‍රීයව ධර්ම ව්‍යාප්ත කටයුතු සිදු කළ යුතුද යන්න මෙම 'කුටිය, චීවරය හා සිංහාසනයේ රීතිය' තුලින් පෙන්වා දෙයි. මෙම පරිච්ඡේදයේ ඇති 2 වන වැදගත් කරුණ එයයි. රීතිය යනු නිවැරදි මාර්ගය සේ අරුත් ගැන්වේ.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ එය මෙසේ සදහන් වේ, 'යම් පින්වත් පුත්‍රයකු හෝ පින්වත් දියණියක සිව්වණක් පිරිසට මෙම සූත්‍ර ධර්මය උගන්වන්නට රුචි වන්නේ නම් එය සිදු කළ යුත්තේ කෙසේද? එබඳු පින්වත් පුත්‍රයකු හෝ දියණියක පළමුව තථාගතයන් වහන්සේගේ ගන්ධකුටියට එළැඹ තථාගතයන් වහන්සේගේ චීවරය පෙරවා තථාගතයන් වහන්සේගේ ධර්මාසනයෙහි අසුන් ගෙන සිව් වණක් පිරිසට එය දේශනා කළ යුතුය.

මෙම 'තථාගතයන් වහන්සේගේ ගන්ධකුටිය', 'තථාගතයන් වහන්සේගේ චීවරය' හා 'තථාගතයන් වහන්සේගේ සිහසුන' යන කරුණු 3 න ඉතා වැදගත්, විශිෂ්ඨ වදන් බව තේරුම්ගත යුතුය.

මේ තුන් රීතීන් වල අරුථ, 'තථාගතයන් වහන්සේගේ ගන්ධ කුටියට එළැඹීම යනු සියලූ සත්වයින්

කෙරෙහි ඇති කර ගන්නා මහා කරුණාවයි, තථාගතයන් වහන්සේගේ චීවරය පෙරවා ගැනීම යනු මෘදු බවෙන් හා ඉවසීමෙන් යුතු වීමයි, තථාගතයන් වහන්සේගේ සිංහාසනයේ අසුන් ගැනීම යනු සියලු සංස්කාරයන්ගේ සමානාත්මතාව හා ශූන්‍යතාව පිළිබඳ යෝනිසෝ මනසිකාරයෙන් යුතු වීමය' සේ සරළව පැහැදිලි කර තිබේ. එනම් 'මහා කරුණාව', 'මෘදු බවෙන් හා ඉවසීමෙන්' හා 'සමානාත්මතා හා ශූන්‍යතාවයේ ප්‍රඥාව' යන කරුණු 3න වැදගත්කොට සලකමින් ධර්මය දේශනා කළ යුතු බව කියාදෙයි.

මෙහි ඇති, 'මහා කරුණාව', 'මෘදු බවෙන් හා ඉවසීමෙන්' යන කරුණු ගැන පැහැදිලි කිරීම අවශ්‍ය නැතැයි සිතන නිසා, අවසාන කරුණ වන 'සමානාත්මතාව හා ශූන්‍යතාවයේ ප්‍රඥාව' ගැන පමණක් පැහැදිලි කරමු.

'ශූන්‍යතාවය' ආකාර 2 කින් යුතුය. පලමුවැන්න, සෑම සියළු දෙයක්ම ශූන්‍යතාවයෙන් යුතුය ලෙස බැලීම. එනම්, සෑම සිදුවීමක්ම ශූන්‍යතාවයෙන් යුතු, තාවකාලික සිදුවීම් ලෙස දැකිය යුතුය. සැබවින්ම එය නිවැරදි දැක්ම නොවේ. නමුදු ඒ තුලම ඇලී සිටීමෙන් මනුෂ්‍යයන් ලෙස දුකින් මිදීමට නොහැකිවේ.

අපි විසින් එම ශූනතාවය ගැන වඩා ප්‍රායෝගිකව කල්පනා කළ යුතුය. සෑම සිදුවීමක්ම ශූන්‍යතාවයෙන් යුතු වනවා යනු, මෙලොවෙහි කිසිම පැවැත්මක් නැති, කිසිම දෙයක් නොමැති බව නොවේ. හේතුව හා තත්වයන්ට අනුකූලව පැවැත්මන් ඇති වන බවයි. නමුත් සදාතනික වු ස්ථිර කිසිම දෙයක් නොමැත. එබැවින්, යහපත් ප්‍රතිපලයන් බලාපොරොත්තු වනවා නම්, යහපත් හේතුවක් බවට පත්වීම හා යහපත් තත්වයකින් මුහුණ දීම වැදගත් වේ.

එම කරුණ 'විවිධාර්ථ සූත්‍රයේ, 2 වන පරිච්ඡේදය වන ධර්ම දේශනාව'තුල මෙසේ සදහන් වේ. 'ආරම්භයේ සිට මේ දක්වා සියලු සංස්කාර ධර්මයන්ගේ ස්වභාවයන් ස්වරූපයන් ශූන්‍යතාවයන් නිශ්චලතාවයන් විශාල බවක් කුඩා බවක් නැතිව උත්පත්තියක් හෝ චුතියක් නැතිව නිසල හෝ සසළ බවකින් තොරව ඉදිරියට යාමක් හෝ පසු බැමක් නැතිව හිස් අවකාශය සේ ද්වි ස්ථනයකින් තොර බව දැන ඉගෙන ගත යුතුය. එය මනාව ප්‍රගුණ කළ යුතු ය. එය එසේ වත්ද, මෝහයෙන් මුලා වූ සත්වයෝ මෙසේ කියමින් මෙය සාවද්‍ය ලෙස ග්‍රහණය කර ගනී. 'මෙය එක දෙයකි එය තව දෙයකි මෙය ලාභ දායකය එය අලාභ දායකය 'මෙසේ අවැඩක්ම වූ සිතිවිලිවලට අවකාශනය වී, නපුරු ක්‍රියාවන්ට පොළඹවන සය භවයන්හි අකුසල් රැස් කරමින් අන්ත වු කල්ප කාලයක් සසරින් මිදීමක් නොමැතිව අනේක දුක්ඛයන්ට ගොදුරු වේ.' සෑම සියළුදෙයකම යථා ස්වභාවය නම්, ස්ථිර වු වෙනස්කම් වලින් තොරව සමානාත්මතාවයෙන් සුසංයෝග වී පවතී. එනම් සෑම සිදුවීමකම හොඳයි හෝ නරකයි කියා දෙයක් නොමැත.

සාමාන්‍ය මනුෂ්‍යයන්ට එය නොතේරෙන බැවින්, නිතරම වෙනස්කම් පමණක් දකිමින් අයහපත් හැඟීම් ඇතිකරගෙන දුක් වේදනාවට පත්වේ. එය සාමාන්‍ය මනුෂ්‍යයන්ගේ වැරදි අවබෝධයයි. අප තේරුම් ගත යුත්තේ සෑම සියළු දෙයකම පැවැත්ම වෙනස්කම් වලින් තොරව, සමානාත්මතාවයෙන් සුසංයෝග වී පවතින බවය. තවත් ආකාරයකින් පවසනවානම්, සෑම සියළු දෙයක්ම අවශ්‍යතාවයන් ඇතිව හටගනි, මනුෂ්‍යයන් වන අපද එසේමය.

අප මේ ලොවට බිහිවීමේ අවශ්‍යතාවයක් තිබුණ නිසා, මේ ආකාරයේ හැඩයකින් යුතුව ඉපදුනේය. ඒ ගැන සිතා මනුෂ්‍යයෙකු ලෙස මෙලොවට බිහිවීමේ වටිනාකම, සෑම දෙනගේම පිහිටෙන් ජීවිතය ගත කිරීමට හැකිවීමේ කෘතවේදීත්වය හදවතට හා මනසට බද්ධ කරගත යුතුය. ඒ හා සමානවම අන්‍යයන්ද අවශ්‍යතාවයක් ඇතිව මෙලොවට ඉපදුනි, එබැවින් ඔවුන්ටද ගෞරව කළ යුතුය.

ඉහතින් සදහන් කළ 'ශූන්‍යතාවය' හි අරුථ මේ අයුරින් භාර ගන්නේ නම්, ජීවත්වීමේ වටිනාකම හා කෘතවේදී බව ටිකෙන් ටික අත්විදීමට හැකිවේ. එසේම සෑම





පුද්ගලයෙකුම තමා හා එක හා සමානව ජීවිතයක් ලබාඇති සහෝදර සහෝදරියන් යන හැඟීම ඇතිවේ. එමනිසා අන්‍යයන්ට ධර්මය දේශනා කිරීමේදී, 'තථාගතයන් වහන්සේගේ සිංහාසනයේ අසුන් ගෙන' යන්නෙහි අරුථ පරිපූර්ණ වශයෙන්ම ශුනතාවය පිළිබඳ හොදින්ම අවබෝධ කරගෙන කටයුතු කිරීම එහි පදනම් බව කියාදේ.

මෙම තුන් රීතින් ගැන සරළව පවසනවා නම්, 'අන්‍යයන්ට ධර්මය සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කරන විට, මෛත්‍රිය හා දයාවේ හදවතින්, පරිපූර්ණ වශයෙන්ම ශුන්‍යතාවය පිළිබඳ හොදින්ම අවබෝධ කරගෙන, නිහතමානීත්වයෙන් වාගේම නින්දා ප්‍රශංසා වලට නොසැලෙන අධිෂ්ඨානයකින් යුතුව කටයුතු කළ යුතුය' ලෙස කියාදෙයි. මෙය 'ධර්මාචාර්යතුමෙක' පරිච්ඡේදයේ ඇති හරය වේ,



මේ මස සිට නික්යෝ නිවානෝ තුමා විසින් රචිත
『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』

කෝසෙයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P104-P109

# Director's Column

## වෙනස්කම් පිළිගෙන සමගියෙන් කටයුතු කිරීමේ හදවත

ජුලි මාසයේදී, අප සංවිධානය ඇමරිකා මහද්වීපයට ව්‍යාප්ත වීමේ 60 වන සංවත්සරය සමරන ලදී. එයට සහභාගී වූ 300 ක පිරිසක් සමඟ මේ දක්වා පැමිණි ගමනට හදවතින් කෘතවේදී වී, ඉදිරි ධර්ම ව්‍යාප්ති කටයුතු වෙනුවෙන් නව අධිෂ්ඨානයක්ද ගොඩනැගූහ.

ඒ හා සමගාමීව බ්‍රසීල ධර්ම ශාඛාවේ 48 වෙනි සංවත්සරයද සමරන ලදී.

එම උත්සව දෙකටම පොදු වූවේ, කුඩා දරුවන් හා තරුණ පිරිස එකිනෙකා දීප්තිමත් පෞරුෂත්වයෙන් යුතුව කටයුතු කිරීමේ ස්වරූපයයි. අන් අයට වැඩදායක තරුණයෙක් වියයුතුයි, අන් අයට සතුටු කල යුතුයි යන හැඟීම ඔවුන් තුලින් ඉහවහා ගොස් තිබුනි.

එය මේ මස නිච්කෝ සෙන්සෙයිගේ මාසික පණිවුඩය තුල ඇතුලත් වූ, අපි එකිනෙකාගේ හද පත්ලේ තිබෙන 'අන්‍යයන්ට ආදරය කරමින් මෛත්‍රිය දැක්වීම' යන හැඟීමෙන් දීප්තිමත් වූ බෝධිසත්වයන්ගේ ස්වරූපය විය.

එසේම, අගෝස්තු මාසයේ ජර්මනියේදී 10 වන ලෝක ආගමික නායකයන්ගේ සාම සමුළුව (WCRP) පැවැත්වුනි. 'මෛත්‍රියේ පුහුණුව තුලින්, අනාගතය වෙනුවෙන්...... එක්වන්නා වූ ජීවයන්' සේ නම් කෙරුණ එහි තේමාව සඳහා, ආගමික නායකයන් විසින් ප්‍රායෝගිකව කළ යුතු දෑ  පිළිබඳව සාකච්ඡා කෙරුනි.

අපිද පවතින්නාවූ වෙනස්කම් පිළිගෙන, සාමකාමි ජීවිතයක් ජීවිතයක් ගත කිරීම සඳහා එදිනෙදා ජීවිතයේ හදවතින්ම කැපවී කටයුතු කරමු.

රි.කෝ.කා. අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී
කෝයිචි සයිතෝ මහතා



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212FAX: 1-808-455-4633
Email: info@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
POBox 33636, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, USA
POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 FAX: 1-650-359-6437
Email: info@rksf.org URL: http://www.rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809 Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-262-4437
Email: info@rkina.org URL: http://www.rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692042, San Antonio, TX 78269, USA
TEL: 1-210-561-7991 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 FAX: 1-253-945-0261
Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

Facebook: https://www.facebook.com/rishokosseikaidobrasil
Instagram: https://www.instagram.com/rkkbrasil

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP, CEP 08730-000, Brasil

**在家佛教韓国立正佼成会**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571 FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571 FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會**
台湾台北市中正區衡陽路 10 號富群資訊大廈 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633 FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會**
台湾台南市崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478 FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059, West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218 Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406 FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL/FAX: 880-31-626575

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Patiya**
China Clinic, Patiya Sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni,**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Dhaka**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar, Ramu Shibu**

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960 Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
2F Ikh Mandal building, Khurenbulag bag, Bayan-Undur sum,
Orkhon province, Mongolia

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949 Email: roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230 FAX: 03-5341-1224 URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**